සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**දෙවන වාර පරීක්ෂණය 2018** | **11 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** | **தரம் 11**
**Second Term Test 2018** | **Grade 11**

**නර්තනය (දේශීය) I**
**Dancing I**

**පැය එකයි**
***One hours***

නම/විභාග අංකය :- ……………………………………………………………………………………………..

**විශේෂ උපදෙස් -**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල , දී ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුරු තෝරා, ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, නිවැරදි පිළිතුරුට සැසඳෙන කවය තුළ ( x ) ලකුණ යොදන්න.**

---

ප්‍රශ්න අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන් වලට සුදුසු වචන තෝරන්න.

(1) පරිසරයේ දක්නට ලැබෙන මිනිස් චරිත ඇසුරින් නර්තන නිර්මාණය කිරීමේ දී "පැදීම" හා "පැගීම" යන ක්‍රියාකාරකම් භාවිතා කළ හැකි චරිත දෙකකි. ……………………………………………………………

i. තේ දළු නෙලන්නිය හා ගොවියා
ii. ගොවියා හා කුඹල්කරු
iii. ධීවරයා හා කුඹල්කරු
iv. ධීවරයා හා තේදළු නෙලන්නිය.

(2) ප්‍රස්තාරකරණයේ දී " ……………………… " සළකුණු මගින් අවග්‍රහය පෙන්වයි.

i. +
ii. ◡
iii. —
iv. ∧

(3) "රන්විලි දෙකොනට සොඳින් තබන්නේ " මෙම කවි පදය අයත් වන්නේ …………………………………… නැටුමටයි.

i. කුලු
ii. ගොයම්
iii. ලී කෙළි
iv. මෝල් ගස්

(4) සිංහරාජ වන්නම වෛරොඩි වන්නම තුරගා වන්නම හා හනුමා වන්නම යන වන්නම් අතරින් දෘත ලයට නැටීමට වඩාත් සුදුසු වන්නේ …………………………………………… යි.

i. සිංහරාජ වන්නම.
ii. හනුමා වන්නම.
iii. වෛරොඩි වන්නම.
iv. තුරගා වන්නම.

(5) දෙසුළු මහා තුන්තිතට අයත් තාල රූපය, මාත්‍රා …………………………………………………………… වේ.

i. 2 + 2 + 3
ii. 2 + 3 + 4
iii. 2 + 2 + 4
iv. 2 + 4 + 2

(6) පිරිත් හුයේ කවි හා ග්‍රහපන්ති කවි …………………………………………………………… ශාන්තිකර්මයට අයත් වේ.

i. බලි.
ii. කොහොඹා කංකාරිය.
iii. දදෙවොල් මඩුව.
iv. පහන්මඩුව

(7) ලී දැතට ගෙන කණුවක් වටේ රටා මවමින් නටන ද්‍රවිඩ ගැමි නැටුම ……………………………… වේ.

i. කෝලාට්ටම්.
ii. පින්නල් කෝලාට්ටම්
iii. කාවඩි.
iv. කරගම්.

(8) " කඳවුරු සිරිත " හා " සද්ධර්ම රත්නාවලිය " කෘති ……………………………………… යුගයේ නර්තන කලාව පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍ර වේ.

i. ගම්පොල යුගයේ
ii. කෝට්ට යුගයේ
iii. මහනුවර.
iv. දඹදෙනි.

(9) ලංකාවේ ලියවුනු සංදේශ කාව්‍ය අතරින් ……………………………………… ප්‍රථම සංදේශ කාව්‍ය වශයෙන් නම් කෙරේ.

i. සැවුල් සංදේශය.
ii. මයුර සංදේශය
iii. තිසර සංදේශය
iv. කහකුරුළු සංදේශය.

(10) මුල්ම සිංහල ප්‍රශස්ති කාව්‍ය ලෙස පිළිගනු ලබන්නේ ...................................................................... ය.

i. පැරකුම්බා සිරිතයත ii. ශ්‍රී නාමය iii. පවන iv. ශෘංගාරාලංකාරය

(11) 

මෙම ඡායාරූපයෙන් පිළිඹිබු වන්නේ,

i. හාස්‍ය රසයයි.

ii. විශ්මයයි.

iii. වීර රසයයි

iv. රෞද්‍ර රසයයි.

(12) හටන් කවි ගායනා කරන නර්තන අංගයකට, රංග භාණ්ඩයක් ලෙස යොදා ගත හැකි මෙවලමකි.

i. චාමරය. ii. සවරම. iii. කඩුව. iv. පතුරු

(13) රංග භූමි සැරසිළි අතර වෙස් අත්ත දක්නට ලැබෙන්නේ

i. සොකරි නාටකයේ ය. ii. දෙවොල් මඩුවේය.

iii. පහන් මඩුවේ ය. iv. කෝලම් නාටකයේ ය.

14) උඩරට වන්නම් රචනා කරන ලද්දේ

i. රම්මොලවක අධිකාරම් විසිනි. ii. ගණිතාලංකාර විසිනි.

iii. බරණ ගණිතයා විසිනි. iv. දෙවන පරක්‍රමබාහු රජකුමා විසිනි.

(15) නර්තන ශිල්පිනියන් අතර හිස් වෙස් තබා ප්‍රසිද්ධියට පත් කාන්තාවක් වන්නේ

i. චිත්‍රා අල්ගම මහත්මියයි. ii. සීතා ගමගේ මහත්මියයි.

iii.චන්ද්‍රලේඛා පෙරේරා මහත්මියයි. iv. වජිරා චිත්‍රසේන මහත්මියයි

(16) පිළිවෙලින් සබරගමුව නර්තන හා උඩරට නර්තන සම්ප්‍රදායන්ට අයත් නාට්‍යමය පෙළපාලි වන්නේ.

i. වැදියක්කම හා ගුරුගේමාලාව යි. ii. අසුරයක්කම හා ගුරුගේ මාලාවයි.

iii. අඹවිදමන හා අසුරයක්කමයි. iv. ගුරුගේමාලාව හා අසුරයක්කම යි.

(17) "සෙමරය" යනුවෙන් හඳුන්වන්නේ

i. අවාන ii. සේසත. iii. චාමර iv. සේලය

(18)



A B C

ඉහත සඳහන් ඡායාරූප පිළිවෙලින් මෙසේ වේ.

i. මුදලි, ලෙංචිනා, හෙංචා ii. මුදලි , ලෙංචිනා, පරයා

iii. පොලිස්, පුරංසිනා, පරයා iv. හේවා, ලෙංචිනා, හෙංචා

(19) "කුඹි කතාව" මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍ර හා පසුතල නිර්මාණය කරන ලද්දේ

i. සෝමබන්දු විද්‍යාපති වේ. ii. මහේෂ් උමගිලිය වේ.

iii. අංජලිකා චිත්‍රසේන වේ. iv. හේෂ්මා විග්නරාජ වේ.

(20) කතුරු ඔංචිල්ලාව පිළිබඳ කියවෙන කවියකි.

i. පුරවර මැද බැඳි රංඔංචිල්ලා -- ii. පඳින කලට අඟනෝ ඔංචිල්ලා ----

iii. අටදෙන අටකොන වාඩි වෙයල්ලා --- iv. අර බලන්න ඉර ගිරවිගේ පැටියෝ -----

(21) දේශීය නර්තන සම්ප්‍රදායන්වල එන වන්නම් නර්තනයේ දී යොදාගනු ලබන්නේ

i. ප්‍රකාශනාත්මක චලනයයි. ii. රිද්මානුකූල චලනයයි.

iii. අභිචලනයයි. iv. තාලානුකූල චලනයයි.

(22) නීතිඥ චාර්ල්ස් ඩයස් මහතා විසින් නිර්මාණය කරන ලද ගීතයකි.

i. මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ ------- ii. හනික වරෙව් කොල්ලනේ ----

iii. විජයතුමා තම්මැන්නේ ---- iv. වාසනා දිනේකි මේක -----

(23) ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ මුද්‍රා නාට්‍ය අතරින් " බතේ උපත " නිර්මාණය කරන ලද්දේ

i. ප්‍රේමකුමාර එපිටවල ii. පණිභාරත මහතා

iii. වසන්ත කුමාර මහතා. iv. ජේ.ඊ.සේදරමන් මහතා

(24) " ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ " මෙම කවියෙන් රංග ගතවන චරිතය

i. වෙදරාල. ii හෙංචා. iii. පරයා. iv. ආඬිගුරු.

(25) කථකලි නැටුමේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය

i. චෙන්ඩාවයි. ii. තබ්ලාවයි. iii. පුං බෙරයයි. iv. මෘදංගයයි.

(26) කථකලි නර්තනය ප්‍රචලිත කිරීම සඳහා පිහිටුවන ලද ආයතනයක් වන්නේ.

i. ශාන්ති නිකේතනය. ii. කලාක්ෂේත්‍රය

iii. භාත්ඛණ්ඩ විශ්වවිද්‍යා පීඨය. iv. කේරළ කලා මණ්ඩලම්.

- **ප්‍රශ්න අංක 27 සහ 28 සඳහා නිවැරදි පිළිතුරු පහත වගුව ඇසුරින් තෝරන්න.**

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A | විදුලි ආලෝකය | වර්ණ ගැලපීම | සම්ප්‍රදාය |
| B | අවකාශ භාවිතය | ප්‍රේක්ෂකාගාරය | දිසා හා තල |
| C | භාව ප්‍රකාශනය | හැඩතල | සාත්වික අභිනය |
| D | නිර්මාණකරණය | රංගභූමිය | ඇඳුම් පැළඳුම් |

(27) සාර්ථකව අංග රචනය කිරීමෙන් වඩාත් තීව්‍ර වන්නේ.

i. A තීරුවේ අංක 1 හා 2 වේ. ii. B තීරුවේ අංක 2 හා 3 වේ.

iii. C තීරුවේ අංක 1 හා 3 වේ. iv. D තීරුවේ අංක 1 හා 3 වේ.

(28) වේදිකාව සඳහා රංග වස්ත්‍රාභරණ නිර්මාණයේ දී වඩාත් සැළකිල්ලට ගත යුත්තේ

i. A තීරුවේ අංක 1 හා 2 වේ. ii. B තීරුවේ අංක 2 හා 3 වේ.

iii. C තීරුවේ අංක 2 හා 3 වේ. iv. D තීරුවේ අංක 1 හා 2 වේ.

(29) ශාන්තිකර්මයක දක්නට ලැබෙන ප්‍රධානතම සැරසිල්ල වනුයේ

i. තටුව , මැස්ස සහ වෙස් අත්තය.  ii. වීදිය , ඊ ගහ සහ පොල්පන්දමය.

iii. වීදිය , තොරණ සහ යහනය.  iv. තටුව , ඊ ගහ සහ මල්යන්ය.

(30) පාසල් නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සඳහා දායක වූ ශිල්පිනියක් ලෙස නම් කළ හැක්කේ

i. වජිරා චිත්‍රසේන ය.  ii. මීරියම් පීරිස් ය.

iii. මිරැණ්ඩා හේමලතා ය.  iv. චන්ද්‍රලේඛා පෙරේරා ය.

## II – කොටස - උඩරට නර්තන සම්ප්‍රදාය

(31) ගැටබෙරයේ දකුණු ඇස සඳහා යොදාගන්නා සම් වර්ග වේ.

i. වඳුරු , හරක්  ii. හරක් , එළු  iii. එළු , මුව  iv. තලගොයි , වඳුරු

(32) " තකට තකට තක තරිකිට කුංදත් තා - තක ජිජි කුද ----- " යන කස්තිරම අයත් ගොඩ සරඹය වන්නේ

i. පැනීමේ සරඹයයි.  ii. චන්ද්‍රිකා හරඹයයි.

iii. බඹර සරඹයයි.  iv. දෑත පැගීමේ හරඹයයි.

(33) පිළිවෙලින් උරමාලය හා දෙවුර මාලය පළඳින්නේ

i. හිසට හා උරබාහු වලටය.  ii. උරබාහු වලට හා කරටය.

iii. උරහිසට හා දෙඅත්වලටය  iv. හිසට හා අතේ මැණික් කටුව අසලටය.

(34) උඩරට නැටුම් සම්ප්‍රදායේ වට්ටම්

i. දෙකකි.  ii. තුනකි.  iii. එකකි.  iv. හතරකි.

(35) හත් පදයට අයත් නර්තන අංගයකි.

i. දළුමුර පදය.  ii. කොතල පදය.  iii. තැඹිලි පදය.  iv. හමාර පදය.

(36) මාත්‍රා 2 + 3 තිත් රූපයට අයත් බෙර පදයකි.

i. දොං දොං ජිං ජිං ගජිගත  ii. දොං දොංත තකු දොං

iii. දොං ජිංත ගත දොංත  iv. දොං ජිං ජිං තකට තොංතක

(37) කොහොඹා කංකාරියෙහි එන ගායනා සහිත නර්තන අංගයකි.

i. යක්තුන් පදය.  ii. මඩුපුරය.  iii. හත්පදය.  iv. යක්ඇනුම

(38) උඩරට නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් කළ ප්‍රවීන නර්තන ශිල්පියෙකි.

i. එස් පණීභාරත.  ii. කේ.එස්. ප්‍රනාන්දු

iii. සව්රිස් සිල්වා.  iv. රදල්ලේ පොඩි මහත්තයා.

(39) කොහොඹා කංකාරියට පමණක් අයත් වන චාරිත්‍ර විධියකි.

i. කප් සිටුවීම.  ii. මිල්ල කැපීම.  iii. මඩුපේ කිරීම.  iv. හඟලේ යැදීම

(40) " මඩුපුරය " නර්තනයට ගැනෙන රංග භාණ්ඩය වන්නේ

i. ඊ තලය යි.  ii. කොතලය යි.  iii. පොල්මල යි.  iv. වංගෙඩිය යි.

## III – කොටස - පහතරට නර්තන සම්ප්‍රදාය

(31) පහතරට බෙරය වාදනය කරන ශාන්තිකර්මයකි.

i. වලියක් මංගල්‍ය　　ii. කුමාර සමයම.

iii. කිරිකොරහේ ශාන්තිය.　　iv. මහසොහොන් සමයම.

(32) " ගුදිත ගදිත ගත ගත් දෑහිං ගුං දෑහිං ------" යන ඉරට්ටිය, ඉලංගම් සරඹවල

i. 10 වේ.　　ii. 9 වේ.　　iii. 12 වේ.　　iv. 11 වේ.

(33) දෙවොල් මඩු යාගයේ සාමූහික නර්තන අංගයක් සඳහා භාවිතා වන ඇඳුම් කට්ටලය.

i. තෙල්මේ.　　ii. වඩිගපටුන.　　iii. රිරියකා.　　iv. නාගරාක්ෂ.

(34) මාත්‍රා 2 + 3 අයත් බෙර පදයකි.

i. ගුංද දෙගත ගති ගත ගුද　　ii. ගුද ගති ගත ගුද ගති ගත

iii. ගුංද ගති ගත ගත්ත ගති ගත　　iv. ගුං දෙගත ගත්ත ගුං.

(35) දෙවොල් මඩුවේ " වහල " නර්තන අංගය නටනු ලබන්නේ

i. කතරගම දෙවි වරමිනි　　ii. දැඩිමුණ්ඩ දෙවි වරමිනි.

iii. දෙවොල් දෙවි වරමිනි.　　iv. පත්තිනි දෙවි වරමිනි.

(36) දෙවොල් මඩු ශාන්තිකර්මයේ ගායනය සහිත නර්තන අංගයකි.

i. වඩිගපටුන　　ii. කළු යකා　　iii. දෙවොල් නැටීම　　iv. ලව්ජවී

(37) පහතරට නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් ඉටු කළ ප්‍රවීන නර්තන ශිල්පියෙකි.

i. රද්දල්ලේ පොඩි මහත්තයා.　　ii. කේ.එස්. ප්‍රනාන්දු.

iii. ජී.වී. හීන්නිලමේ　　iv. එස්. පණීභාරත.

(38) පහතරට සිංදු වන්නම් තිස්දෙකට ඇතුළත් වන්නමකි.

i.අනුරාග දණ්ඩතාලය.　　ii. කදම්බ පක්ෂි.　　iii.අනිලා.　　iv. අසදෘෂ

(39) යකදුරා ඊ ගස අතට ගන්නේ

i. දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීමටය.　　ii. ග්‍රහයන්ගේ ආකර්ෂණය ලබා ගැනීමටය.

iii. අලංකාරය පිණිසය.　　iv. යකුන් මෙල්ල කිරීමටය.

(40) ගුද ගති ගත වට්ටමට අයත් තාල රූපය.

i. මාත්‍රා 2 + 3 තාල රූපයටය.　　ii. මාත්‍රා 3 + 3 තාල රූපයටය.

iii. මාත්‍රා 2 + 2 තාල රූපයටය.　　iv. මාත්‍රා 2 + 4 තාල රූපයටය.